# <u>තත්ත්ව පාලනයේ නියමුවෝ (ගුරුන්)</u>

තත්ත්වය, තත්ත්ව පාලනය යන වචන 1950 දශකයේ මුල් භාගයේ දී ඇමරිකානුවන් විසින් සාකච්ඡා කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් කළමනාකරණ විශේෂඥයින් මේ පිළිබඳ දැඩි උනන්දුවක් දක්වන ලදී. 1950 දශකයේ අග භාගයේ දී මෙය ජපානයට ව්‍යාප්ත වීමෙන් පසු ජපාන කළමනාකරණ විශේෂඥයින් එම සංකල්ප තව දුරටත් දියුණු කරන ලදී. අවසානයේ ජපානයේ කර්මාන්ත ශාලාවල තත්ත්ව කව, තත්ත්ව පාලනය යන වදන  ප්‍රමුඛ ලෙස ව්‍යාප්ත විය. මෙහි ප්‍රතිඵලය වූයේ 1970 - 1980 දශකවල දී බටහිර කළමනාකරණ විශේෂඥයින් ජපාන කර්මාන්තවල මෙකී සාර්ථකත්වය අනුගමනය කරමින් තව දුරවත් මෙම සංකල්පය දියුණු කිරීමට එක් විය. මෙසේ තත්ත්වය පිළිබඳ විවිධ කරුණු ඉදිරිපත් කළ ගුරුන් රැසකි.

ප්‍රථමයෙන්ම තත්ත්වය පිළිබඳව වැදගත් සංකල්ප ඉදිරිපත් කරන ලද්දේ ඇමරිකානු ජාතික එඩ්වර්ඩ් ඩෙමින් මහතාය. ඔහු විසින් දක්වන ලද්දේ කළමනාකරණයේ දී ඇති වන ගැටලු 94% ක් පමණ තත්ත්වය පාදක කරගත් ඒවා බවය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද කළමනාකරණයේ ප්‍රධාන මූලධර්ම / කරුණු 14 කළමනාකරණයේ සමස්ත දර්ශනයම පිළිබිඹු කරන්නකි.



Dr Edward Deming

| | |
|---|---|
| **Born** | October 14, 1900, <u>Sioux City, Iowa</u>, <u>USA</u> |
| **Died** | December 20, 1993 (aged 93)<br><u>Washington DC</u>, <u>USA</u> |
| **Fields** | Statistician |
| **<u>Alma mater</u>** | <u>University of Wyoming</u>, <u>University of Colorado</u>, <u>Yale University</u> |

ඔහුගේ PDCA සංකල්පය බෙහෙවින් ප්‍රචලිත වූවකි. ඩෙමින් යනු  ජපානයට ගුණාත්මකභාවය / තත්ත්වය පිළිබඳ හඳුන්වා දුන් පුරෝගාමියාය.

ඉන් අනතුරුව ආචාර්ය ජෝෂප් එම් පුරාන් විසින් තත්ත්ව ත්‍රිකය (Trilogy) හඳුන්වා දෙන ලදී. එම ත්‍රිකය නම් තත්ත්ව සැලසුම්කරණය (Quality Planing) තත්ත්ව පාලනය ( Quality Control) හා තත්ත්ව වර්ධනයයි. (Quality Improvement)  ඔහු කීවේ හොඳ තත්ත්ව කළමනාකරණයක් යනු ඉහත පියවර තුනම අනුගමනය කිරීම යන්නයි.



Dr. Joseph M. Juran

| | |
|---|---|
| **Born** | December 24, 1904,<br><u>Braila</u>, <u>Romania</u> |
| **Died** | February 28, 2008 (aged 103)<br><u>Rye, New York</u>, <u>U.S.</u> |
| **Occupation** | <u>Management consultant</u>, quality guru |

ඩෙමිං හා පුරාන් විසින් මෙම සංකල්පය ජපානයට හඳුන්වා දීමෙන් පසුව ජපානයේ ආචාර්ය කවුරු ඉෂිකාවා විසින් මූලික තත්ත්ව පාලන මෙවලම් 7 ඉදිරිපත් කරන ලදී. ඒවා නම් ආවේක්ෂණ පත්‍ර ( check sheet) , ජාල රේඛ, තීරු ප්‍රස්ථාර (Histogram),පැරටෝ විශ්ලේෂණය, විසිරිත තිත් සටහන්, ( Scatter Diagram) පාලන සටහන් ( Process Control Charts ) වර්ගීකරණය(Statification ) සහ හේතු ඵල සටහන ( Cause and Effect diagram) වේ. හේතු ඵල සටහන, ඉෂිකාවා සටහන ලෙස ද දක්වනු ලැබේ. තවද එය මාලු කටු සටහන ලෙස ද දක්වයි.



Dr Kauru Ishikawa

| | |
|---|---|
| **Born** | July 13, 1915, Tokyo, Japan |
| **Died** | April 16, 1989 (aged 73) |
| **Citizenship** | Japan |
| **Fields** | quality, chemical engineering |
| **Institutions** | University of Tokyo, Musashi Institute of Technology |
| **Alma mater** | University of Tokyo |
| **Known for** | Ishikawa diagram, quality circle |
| **Notable awards** | Walter A. Shewhart Medal, Order of the Sacred Treasures |

ඉන් අනතුරුව ආර්මන්ඩ් V. පෙයින්බම් විසින් පූර්ණ තත්ත්ව පාලන සංකල්පය ( Total Quality Control ) ඉදිරිපත් කරන ලදී. මොහු කීවේ පාරිභෝගික තත්ත්වය සඳහා තත්ත්ව වර්ධනය, තත්ත්ව නඩත්තුව හා තත්ත්ව වර්ධනය යන තුනම ( Quality Development, Quality Maintenance, Quality Improvement) අවශ්‍ය බවයි. ඒ අනුව ඔහු විසින් කරුණු 3ක් අවධාරණය කරන ලදී.

තත්ත්වය ඉහළ නැංවීම සඳහා

01. තත්ත්ව නායකත්වය
02. නව තත්ත්ව තාක්ෂණය
03. ආයතන කැපවීම අවශ්‍ය බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.



Armand V feignbaum

| | |
|---|---|
| **Born** | 1922 |
| **Occupation** | Engineer and Quality control |

Bachelor's degree from Union College, and his master's degree and Ph.D. from **Massachusetts Institute of Technology** (**MIT**)

ආචාර්ය ගෙනිචි ටගුචි ( Genchi Shingo) විසින් දක්වන ලද්දේ සියලුම සාධක පාලනය කරනවාට වඩා ශක්තිමත්, වෙනස් වීමකට සංවේදී නොවන නිර්මාණයක් ( Design එකක්) වැදගත් බවය. මේ හේතුව නිසා නිෂ්පාදන නිර්මාණ ( Product Design) වල දී සැලසුම් කරුවන්ගේ අවධානය ශක්තිමත් නිර්මාණයන් වෙත යොමු කරන ලදී.



Dr Genichi Taguchi

| | |
|---|---|
| **Born** | January 1, 1924, Tokamachi, Japan |
| **Citizenship** | Japan |
| **Fields** | Engineering, Statistics |
| **Institutions** | Aoyama Gakuin University |
| **Alma mater** | Kyushu University |
| **Known for** | Taguchi methods |
| **Influences** | Matosaburo Masuyama |
| **Notable awards** | Indigo Ribbon, Shewhart Medal |

ෂිජියෝ ෂින්ගො (Shigeo Shingo) තත්ත්ව කළමනාකරණයේ දී Just in time පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලද්දෙකි. තවද ඔහු වැරදි නැති කිරීම ( Mistake Profing – Poka yoke System) පිළිබඳ දැඩිව විශ්වාශ තැබුවෙකි. ඔහු කීවේ වැරදි පරීක්ෂා කර නිවැරදි කිරීම ඉතා වැදගත් බවයි. එම වැරදි සහිත භාණ්ඩ පාරිභෝගිකයාට ඉදිරිපත් කළ විට දෝෂ සහිත භාණ්ඩ වන බැවින් එය වැලැක්විය යුතු බව ඔහු දක්වන ලදී. Toyota Production System හඳුන්වා දීමේ කොටස් කරුවෙකුද විය.



Shigeo Shingo

| | |
|---|---|
| **Born** | 1909-1990, in Saga City, Japan |

තත්ත්වය පිළිබඳ කථා කළ බටහිර ලෝකයේ පුද්ගලයෙක් වශයෙන් Phlip B Crosby ( පිලිප් ක්රෝස්බි) හැදින්විය හැක. ඔහු කීවේ තත්ත්වය නොමිලේ ලැබෙන බවය ( Quality is free). එසේම ඔහු විශ්වාස කළේ දෝෂ බිංදුව වීමය. ( Zero Defects) ඒ අනුව ඔහු කීවේ තත්ත්වය යනු

- නියමිත මට්ටම්වලට අනුගත වීම.
- දෝෂ වැලැක්වීම.
- දෝෂ බිංදුව දක්වා ගෙන ඒම.
- තත්ත්වය මැනීම යනු නියමිත මට්ටම්වලට අනුගත නොවීමේ වැය යනුවෙනි.



Phil Crosby

| | |
|---|---|
| **Born** | Philip Bayard Crosby<br>June 18, 1926<br>Wheeling, West Virginia, USA |
| **Died** | August 18, 2001 (aged 75)<br>Winter Park, Florida, USA |
| **Occupation** | Quality Guru |

තත්ත්ව ගුරුන් අතරට එක් වන නවතමයෙක් වන්නේ Tom Peter ය .ටොම් පීටර් සඳහන් කළේ තත්ත්ව පාලන ක්‍රියාවලි තුළ මූලිකම හරය නායකත්වය බවයි. Management ( කළමනාකරණය) යන වචනය වෙනුවට Leadership (නායකත්වය) යන වචනය යොදා ගැනීමට පෙලඹුණු අතර ඔහු කීවේ ඇවිදමින් කළමනාකරණය ( Managing by walking about) ඉතා වැදගත් බවයි. එමගින් කළමනාකරුවෙකුට, පාරිභෝගිකයන් සමඟ සම්බන්ධ වීමට, නිර්මාණ ශිලී බව කරා යාමට, මිනිසුන් සමඟ හැසිරීමට ඉඩ ලැබෙන බවයි. එය විශිෂ්ටත්වයට මාවත බව දක්වන ලදි.



Tom peter

| | |
|---|---|
| **Born** | November 7, 1942 (age 67)<br>Baltimore, Maryland |
| **Nationality** | United States |
| **Occupation** | Author, Consultant |

තත්ත්ව පාලනයේ දී අමතක කළ නොහැකි තවත් පුද්ගලයෙකු වන්නේ වෝල්ටර් ෂු හාට් ( Wallter Shewhart) ය. මොහු තත්ත්ව කව මෙවලම්වල, පාලන සටහන් සංකල්පය ( Process Control Charts ) ඉදිරිපත් කළේය. පාලන සටහන් සංකල්පය නිෂ්පාදන ක්‍රියාවලියක නිවැරදිභාවය පරීක්‍ෂා කිරීම සඳ හා ඇති ඉතා ප්‍රයෝජනවත් මෙවලමකි.



Dr. Walter A Shewhart

| | |
|---|---|
| **Born** | March 18, 1891, New Canton, Illinois |
| **Died** | March 11, 1967 |
| **Fields** | Physics, Engineering, Statistics |
| **Institutions** | Western Electric<br>University of Illinois,<br>University of California, Berkeley |


ලේඛක උපාලි මාරසිංහ
අධ්‍යක්‍ෂ
ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය